00016

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩ සටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU4115- අධ්‍යාපන කළමනාකරණය**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.26** **වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30**

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. සුදුසු නිර්වචනයක් ඇසුරින් "කළමනාකරණය" විස්තර කරන්න.

02. "කළමනාකරණය" හා " පරිපාලනය" අතර වෙනස දක්වන්න.

03. 1 AB පාසලක සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.

04. පාසල් පාදක ළමනාකරණයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "කාර්යක්ෂමතාව" හා "ඵලදායිතාව" පිළිගත් නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

06. " බලය" හා "අධිකාරිය" වෙන්කර දක්වන්න.

07. පාසැලේ කළමනාකරණ ක්‍රියාවලියට, ගුරුවරයකුට දායක විය හැකි ආකාරය නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ පවත්නා ගැටලු තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)



19

## II වන කොටස

09. (i) මැක්ස් වෙබර් විසින් හඳුන්වාදෙන ලද නිළතන්ත්‍රවාදී ආකෘතිය විස්තර කරන්න.
(ලකුණු 06)

(ii) පාසල තුළ නිළතන්ත්‍රවාදී ආකෘතියක් භාවිත කිරීමේ වාසි හා අවාසි දෙකක් (02) බැගින් දක්වා උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(iii) ඔබ විසින් සඳහන් කරන ලද අවාසි අවම කිරීම සඳහා පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් යොජනා කරන්න.
(ලකුණු 06)

10. (i) "නායකත්වය" යන්න කුමක්දැයි නිර්වචනය කරන්න.
(ලකුණු 06)

(ii) පාසලක විදුහල්පතිවරයකු විසින් ප්‍රදර්ශනය කළයුතු නායකත්ව කුසලතා හතරක් (04) පැහැදිලි කරන්න?
(ලකුණු 08)

(iii) වර්තමාන පාසල් පද්ධතිය තුල විදුහල්පතිවරුන්ගේ නායකත්ව කුසලතා වර්ධනය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හතරක් (04) යෝජනා කරන්න.
(ලකුණු 08)

11. (i) "අධීක්ෂණය" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) සායනික අධීක්ෂණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා සායනික අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අගයන්න.
(ලකුණු 08)

12. (i) ඵලදායී පාසලක ලක්ෂණ හතරක් (04) උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(ii) "ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවත්නා සියලුම පාසල් ඵලදායී පාසල් වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වේ ද? ඔබේ පිළිතුරට හේතු හතරක් (04) දක්වන්න.
(ලකුණු 12)

13. (i) පාසල් කළමනාකරණයේ පවත්නා ගැටලු හතරක් (04) පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(ii) ඉන් එක් ගැටලුවක් තෝරාගෙන, එම ගැටලුව ඇතිවීමට පහත පාර්ශ්වයන්ගේ දායකත්වය දක්වන්න.

(a) විදුහල්පති
(b) ගුරුවරු
(c) ශිෂ්‍යයන්

(ලකුණු 10)

(iii) හඳුනාගත් ගැටලුව විසඳීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන යෝජනා තුනක් (03) දක්වන්න.
(ලකුණු 06)

14. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහය
(ii) ගුරුභූමිකාව හා කළමනාකරණ කුසලතා
(iii) පාසල් සංවිධානය විවෘත පද්ධතියක් ලෙස
(iv) පාසල් සන්දර්භයෙහිලා බ්ලේක් සහ මෝටන් ගේ (Blake & Mouton) කළමනාකරණ ග්‍රිඩයේ අදාළත්වය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -



20